**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව - 2023**

**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම අගයන ලදී.
- හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සකස් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි සඳහන් ආකෘතිය භාවිතා කර නොතිබුණි. | ඉදිරි වර්ෂවල ගිණුම්කරණ ප්‍රමිත 01 හි සඳහන් ආකෘතිය අනුව පිළියෙලකර ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | යොමුගත ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 79 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම්වලට ඒවා වාර්තා කරන දිනයෙන් මාස දොළහක් තුළ උපලබ්ධි වෙතැයි අපේක්ෂා නොකෙරෙන, සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි කිරීම සඳහා තබා ඇති වත්කම් අයත් වන නමුත්, රු.1,926,788 ක් වූ අයකර ගැනීමට නොහැකිවූ වත්කම්, ජංගම වත්කම් ලෙස සටහන් නොකර ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | රු.1,926,788 යනු අයකර ගැනීමට නොහැකි ජංගම වත්කම් නොවන අතර, සේවා ගිවිසුම් අවසන්වීමෙන් පසු එම මුදල ලබාගත හැකි බව දන්වා තිබුණි. | යොමුගත ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 80 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තාකරන දිනෙන් මාස 12 ක් තුළ නිරවුල් කිරීමට නියමිත වගකීම් ජංගම වගකීම් ලෙස හඳුනාගනු ලැබිය යුතු වුව ද, රු.84,801,589 ක් වූ පාරිතෝෂිත වෙන්කිරීම් ඒවායේ නිරවුල් කිරීමට | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 80 (ඇ) ඡේදයට ප්‍රකාරව 2024 මූල්‍ය ප්‍රකාශ තුළ පෙන්වීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ජංගම වගකීම් නිවැරදිව හඳුනාගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | අපේක්ෂිත කාලයන් අනුව ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස ගිණුම්ගත කළ යුතු වුව ද, ඒ අනුව කටයුතු නොකර ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු කරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවත්, කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් රු.36,457,088 ක් වටිනා පරිගණක, කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ යන වත්කම් සමාලෝචනයකර ඒ අනුව ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. | මෙම වසර තුළ තක්සේරු කමිටුවක් පත්කර එම කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බවත්, වරලත් ගණකාධිකරණ ආයතනය මගින් නිකුත් කළ Valuation Guideline අනුව මෙය සිදු නොකළ යුතු බව ද දන්වා තිබුණි. | යොමුගත ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම් සමාලෝචනය කළ යුතු ය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි ඡේද 44 ප්‍රකාරව රජය විසින් සිදු කරනු ලබන ප්‍රදානයන් 2018 ජනවාරි 01 දින සිට වත්කම් සහ අයභාර ලෙස හඳුනාගත යුතු වුව ද, රු.10,300,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් මෙම ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | කොමිෂමට ලැබෙන ප්‍රාග්ධන ලැබීම් සෑම වසරකම Amortize කර ඇති බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය හා මධ්‍යස්ථාන 85 ක පැවති ඉන්වෙන්ට්‍රි අයිතම් වටිනාකම තක්සේරුකර ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | කොමිෂම මෙතෙක් ජංගම වත්කම්හි වටිනාකම අගය කිරීමක් සිදු නොකෙරුණු අතර, ඉදිරි වර්ෂයේ සිට සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ආයතනය සතු සියලු ඉන්වෙන්ට්‍රි අයිතම් වටිනාකම ජංගම වත්කම් යටතේ දැක්විය යුතු ය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 15,656,035 | මිලදී ගැනීමට අදාළ වවුචර්පත්, තක්සේරු වාර්තා | 2009 ට පෙර වත්කම් ලේඛනයක් නොතිබුණු අතර, වත්කම් ලේඛනය පිළියෙල කිරීමේදී ඊට පෙර වර්ෂවල අවසන් ගිණුම් හා මුදල් පොත පදනම් කරගෙන එම දත්ත ලබාගෙන තිබුණු බව ද, මේ සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ක්‍රමයක් නොමැති බවත්, දන්වා තිබුණි. | ස්ථාවර වත්කම්වලට අදාළ ශේෂ තහවුරුකර ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු ය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කලුතර, මීගමුව යන මධ්‍යස්ථානවල ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා රු.426,547 ක් වූ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන්ට ලබාදී මේ වන විට වර්ෂ 02 මාස 9 සිට වර්ෂ 02 ක කාලයක් ගත වී ඇතත්, මෙම අත්තිකාරම් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණු අතර, මෙම මධ්‍යස්ථානවල අලුත්වැඩියා කටයුතු මේ වන විටත් අවසන් කිරීමට ද කටයුතුකර නොතිබුණි. | කලුතර මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය මඟින් කොමිෂමේ වැය ශීර්ෂය යටතේ, අමාත්‍යාංශයට බැර කර ඇති බව ද, මීගමුව මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව සම්බන්ධ ජ'නල් සටහන මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අඩංගු කළ හැකි බව දන්වා තිබුණි. | අත්තිකාරම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට රු.2,428,014 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 01 - 02 ත් අතර රු.402,990 ක් ද, වර්ෂ 02 - 03 ත් අතර රු.707,008 ක් ද, වර්ෂ 3 - 5 ත් අතර රු.67,251 ක් හා වර්ෂ 5 ට වැඩි රු.230,500 ක් ලෙස ණයගැති ශේෂ පැවතිය ද, අදාළ ශේෂයන් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | වසර 5 ට වැඩි මුදල වනුයේ ගම්පහ ශාඛාව සඳහා ගෙවා ඇති තැන්පතු හා ශාඛාවන්හි ජංගම ගිණුම් විවෘත කිරීමේදී තැන්පත් කළ මුදල් වන අතර, මෙය නැවත ලබා ගත හැකි තැන්පතු මුදල් ඉදිරියේදී ලබා ගැනීමට හැකියාව ඇති බව දන්වා තිබුණි. | ණයගැති ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රු.2,390,922 ක් වූ ණයහිමි ශේෂය තුළ වර්ෂ 01 ට අඩු රු.1,200,621 ක් ද, වර්ෂ 1– 2 ත් අතර ණයහිමි ශේෂය රු.513,019 ක් ද, වර්ෂ 3 -5 ත් අතර රු.929 ක් හා වර්ෂ 5ට වැඩි රු.676,353 ක් ලෙස ණයහිමි ශේෂ පැවතිය ද, අදාළ ශේෂයන් ගිණුම්වල ගැලපීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | ගෙවිය යුතු ශේෂයන්හි වර්ෂ 1 හා 2 අතර ශේෂ මේ වසර තුළ ගෙවීම් සිදු කරන අතර වසර 5 ට වැඩි ශේෂය වනුයේ කොමිෂමෙන් සේවය කර ඉවත් වූ පිරිස වෙත දැනුවත් කළ ද චෙක්පත් ලබා නොගැනීම හේතුවෙන් එම චෙක්පත් අවලංගු වී ඇති බව දන්වා තිබුණි. | ණය හිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1982 අංක 43 දරන මුද්දර බදු පනත | රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුව ද, අවස්ථා 26 කදී කරන ලද රු.1,529,961 ක් වටිනා ගෙවීම් සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | ඉදිරියේදී අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | රාජ්‍ය බැංකු තුළ ආයෝජනය කර තිබූ රු.7,748,671 ක් වූ ස්ථාවර තැන්පත් සඳහා පනත ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතීන් ලබාගෙන නොතිබුණි. | ස්ථාවර තැන්පතු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන සිදුකර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මේ සම්බන්ධව යොමුකර ඇති බව දන්වා තිබුණි. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ 2(1) වගන්තිය | කොමිෂන් සභාවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පනත ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබාදී නොතිබුණි. | 2024 වසර සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගෙන ඇති බව දන්වා තිබුණි. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | ආයතන සංග්‍රහයේ 15.1 (i) වගන්තිය | කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පරිපාටියට කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළත්කර ඇති නමුත් | 2023 වසරේදී ප්‍රාථමික සේවා ගනය සඳහා කාර්යක්ෂම කඩඉම් පරීක්ෂණ පැවැත් වූ | යොමුගත ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කොමිෂන් සභාව ආරම්භයේ සිට 2023 වර්ෂය දක්වාම ප්‍රාථමික සේවා ශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා තිබුණි. | අතර, සෙසු තනතුරු සඳහා 2024 වසරේ දෙවන කාර්තුව තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දන්වා තිබුණි. | |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | i. 110 (1) | කොමිෂන් සභාව විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව හානිපාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2024 වර්ෂයේ සිට හානිපාඩු ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | ii. 139(4) | රු.1,590,277 ක් වූ ගෙවීම් වවුචර 41 ක් සඳහා මුදල් රෙගුලාසි පරිදි අදාළ කුවිතාන්සි අමුණා නොතිබුණි. | මධ්‍යස්ථාන 85 කට අදාළව ප්‍රධාන කාර්යාලයට තැපැල් මඟින් ලදුපත් හා වවුචර් එවීමේ දී ප්‍රමාදයන් සිදු වූ බවත්, එම වවුචර් මධ්‍යස්ථාන මගින් ලබාගෙන විගණනය වෙත යොමු කරන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | iii. 237(ආ) | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට ද, අදාළ බඩු ලේඛනයෙහි, තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවට ද, සහතිකයක් ඇමිණිය යුතු වුව ද, ආයතනයේ රු.7,509,063 ක් වූ මිලදී ගැනීම් 45 කදී උක්ත විධිවිධානයන් ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | මින් ඉදිරියට භාණ්ඩ ලද බවට සහතික අදාළ වවුචර වලටම ඇමිණීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | iv. 237(අ)(1) | 2023 වර්ෂයේදී රු.1,958,476 ක් වූ වාහන හා කාර්යාල උපකරණ අලුත්වැඩියාවන් 39 කට අදාළව නිසි පරිදි වැඩ නිමකළ බවට සහතිකයක් ලබාගැනීමකින් තොරව | මධ්‍යස්ථානවල වැඩ හෝ සැපයුම් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී සතුටුදායක ලෙස වැඩකර තිබෙන බවට හා අදාළ ගෙවීම් කිරීමට හැකි බවට | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගෙවීම්කර තිබුණි. | මධ්‍යස්ථාන භාර නීති නිලධාරී විසින් යන්ත්‍රයට අදාළ කාඩ්පතෙහි සහතික කරනු ලබන බවත්, ඉදිරියේදී මෙම කාඩ්පත අදාළ සේවය අවසන් වූ පසු පිටපතක් එවන ලෙසට දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | |
| (උ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතුකර නොතිබුණි. | ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂම ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් ඇප තැබීම අදාළ නිලධාරීන් සහ එහි සීමාවන් පිළිබඳව උපදෙස් අධිකරණ අමාත්‍යාංශයෙන් විමසා ඇති බවත්, ඒ ලද වහාම අවශ්‍ය පියවරගන්නා බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඌ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| | 2016 දෙසැම්බර් 31 දිනැති අංක 30/2016 චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහන තුනක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | වාහනවලට අදාළ ඉන්ධන දහන පරීක්ෂාවන් මේ වනවිට සිදුකර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (එ) | **රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ** | | | |
| | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයේ ඡේද 2.3 උපලේඛන I හි 3 (පොදු ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය) | ප්‍රධාන අයවැය ලේඛනයට ඇතුළත් විය යුතු පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශනය, පුරෝකථනය කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා පුරෝකථනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුළත් කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වාදී ඇති පරිදි සිදු කිරීම අපහසු බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඒ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තරවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු නමුත්, ඒ | 2024 වර්ෂය තුළ සිදු කිරීමට පියවරගෙන ඇති බව දන්වා තිබුණි. | යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

අනුව කටයුතුකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,802,344 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.13,906,980 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,104,636 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විදේශ ආධාර රු.10,027,683 කින් ද, අනෙකුත් ආදායම් රු.1,740,276 කින් ද වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා බැංකුවේ අළුත්කඩේ ශාඛාවේ පවත්වා ගෙනයනු ලබන ජංගම බැංකු ගිණුමේ 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක කාලය තුළ රු.මිලියන 17.4 සිට රු.මිලියන 4.9 දක්වා පරාසයක් තුළ වූ බැවින් එම අතිරික්ත මුදල නිෂ්කාර්ය ලෙස පැවතුණි. | "නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් කළ චෙක්පත්" හි වටිනාකම අඩු වූ පසු මුදල් පොත අනුව ශේෂය විගණනය විසින් පෙන්වාදී ඇති ශේෂයට වඩා අඩු බව දන්වා තිබුණි. | මුදල් නිශ්ක්‍රීයව පවත්වා නොගත යුතු ය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයේදී ලංසු කැඳවීම සඳහා දින 07 ක අවම කාලයක් ලබාදිය යුතු වුවත්, 2023/2024 වර්ෂ සඳහා පවිත්‍රතා සේවා සැපයීමේ ප්‍රසම්පාදනයේ දී නිසි පරිදි පිරිවිතර සකස් නොකර ලංසු කැඳවීමට දින 03 ක පමණ අවම කාලයක් ලබාදීමට කටයුතුකර ඇති අතර, ඒවා ඇගයීම දින 05 ක් යන තුරු සිදුකර නොතිබූ බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ අදාල ආකෘති පත්‍රයේ වාර්තාකර නොතිබූන අතර, මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ප්‍රකාරව තෝරාගත් ආයතනය විසින් අදාළ කාලය සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වසරේ සිට නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනයකර පවිත්‍රතා සේවා සැපයුම්කරුවන් තෝරාගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.595,282 ක් වටිනාකමැති ගෘහ භාණ්ඩ, පොත් රාක්ක හා ටයර් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයන් 09 ක මිල ගණන් කැඳවූ ආකාරය පිළිබඳ ප්‍රසම්පාදන ගොනු තුළ හඳුනාගත නොහැකි විය. | ඉදිරි වසරේ සිට නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනයකර ප්‍රසම්පාදනය සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ප්‍රසම්පාදනයන්ට අදාළ තොරතුරු ගොනු තුළ පවත්වාගත යුතු ය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයෙන් සේවකයින් 88 කගේ එනම් සියයට 24 ක පුරප්පාඩු පැවති අතර, අධ්‍යක්ෂ (නීති) හා අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) යන ප්‍රධාන තනතුරු තුන ද, "කළමනාකරණ" සේවා ගණයට අයත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) හා කොමිෂන් සභාවේ මූල්‍ය පාලනයට සෘජුවම දායක වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරුද "කළමනාකරණ" සේවා ගණයට අයත් නීති නිලධාරි තනතුරු 26 ක් ද 2023 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි. වාර්තාවේ දිනය වනවිට මෙම පුරප්පාඩු පිරවීම වර්ෂ 01 මාස 05 සිට වර්ෂ 05 ක් දක්වා කාලප්‍රමාදයක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා 2022 වසරේ සිට වාර ගණනාවකදී අනුමැතිය සඳහා ඉල්ලීම් ඉදිරිපත්කර ඇතත්, ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව දන්වා තිබුණි. | පුරප්පාඩු අප්‍රමාදව සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | කොමිෂන් සභාවේ බඳවාගැනීමේ පරිපාටිය අනුව ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ සිට ප්‍රාථමික සේවා ගණයේ නිලධාරියා දක්වා වූ නිලධාරීන්ට එක් ශ්‍රේණියක සිට අනෙක් ශ්‍රේණිය දක්වා උසස්වීමේදී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් නොපවත්වා සිදු කිරීමට ඉඩකඩ ලබා දී තිබුණි. | 2023 වසරේ ප්‍රාථමික සේවා ගණය සඳහා විභාග පවත්වා ඇති බවත්, 2024 වසරේ දෙවන කාර්තුව තුළ සෙසු තනතුරු සඳහාත් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | කාර්යසාධන කඩඉම් පරීක්ෂණ නිසි පරිදි පැවැත්විය යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ 2023 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතුකර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණකවරයෙකු ද පත්කර නොතිබුණි. | නීති ආධාර කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන බවත්, ඉදිරියේ දී අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කිරීමට පියවර ගන්නා බව දන්වා තිබුණි. | යොමුගත පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු ය. |